(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 16 දරන නවෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **1999** ජූනි මස **21** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජූනි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **5.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

## 1999 අංක 16 දරන නවෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 ජුනි මස 15 වැනි දින.]

එල්. ඩී.–ඕ. 23/97.

### නවෝදය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"නවෝදය පදනම " යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

ඒ පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු ඒ පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 16 දරන නවෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) නවෝදය පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්, "නවෝදය පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. නවෝදය පදනම සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :– සංස්ථාවේ පොදු පරමාර්ථ.

*(අ)* ඌන වරප්‍රසාද ඇති ළමයින්ගේ සමාජ, අධ්‍යාපන සහ සංස්කෘතික පෝෂණය නංවාලීම ;

(ආ) ළමා අධ්‍යාපනය, පෙර පාසල්, ළමයින් රැක බලා ගන්නා මධ්‍යස්ථාන සහ ළමා නිවාසවලට අදාළ කටයුතුවලට ආධාර කිරීම සහ ඒ කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ජනතාවගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය නංවාලීමේ අරමුණ පෙරදැරි කරගෙන ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩා කඳවුරු සංවිධානය කොට පවත්වාගෙන යාම ;

(ඈ) රැකියා අවස්ථා හා ස්වයං රැකියා අවස්ථා සලස්වාලීමට කටයුතු කිරීම සහ දිළිඳු ජන කොටස්වල ආදායම් නංවාලන ව්‍යාපෘති සැළසුම් කොට ක්‍රියාත්මක කිරීම ;

(ඉ) පරිසරය සංරක්ෂණය කිරීම ;

(ඊ) තරුණ තරුණියන්ගේ ආත්ම විශ්වාසය සහ නායකත්වය වර්ධනය කර ගැනීමට ඔවුන්ට ආධාර වන වැඩ පිළිවෙලවල් සංවිධානය කිරීම ;

(උ) තරුණ, තරුණියන් සඳහා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම;

(ඌ) සංස්කෘතික අගයන් ප්‍රවර්ධනය කිරීම අරභයා ප්‍රදර්ශන, පැවැත්වීම සහ දේශන, සම්මේලන, වැඩ මුළු, සම්මන්ත්‍රණ චාරිකා සංවිධානය කිරීම ;

(එ) මාතෘ දාරක ශුභ සාධක සේවා සැපයීම සඳහා වැඩ සටහන් සංවිධානය කිරීම සහ ප්‍රසූති පූර්ව සහ පශ්චාත් ප්‍රසූති ශුභ සාධනය, පෝෂණය සහ වෛද්‍ය පහසුකම් සැපයීම ;

(ඒ) සෞඛ්‍ය මධ්‍යස්ථාන, ජංගම චිකිත්සාගාර සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කර පවත්වා ගෙන යාම;

(ඔ) ශ්‍රමදාන සහ සෞඛ්‍යදාන ව්‍යාපාර සංවිධානය කිරීම ;

(ඕ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල වෙනත් ආයතන සහ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඒවා සමග අදහස් උදහස් හා වැඩසටහන් හුවමාරු කර ගැනීම;

*(ක)* පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදිය නිකුත් කිරීම සඳහා ඒවාට දායකවීම ; *සහ*

*(ග)* ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන, හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ එකී රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජික සංඛ්‍යාවකින්, සමන්විතවන විධායක කමිටුවක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී නිල දැරූ පදනමේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතුය.

**6**. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කරුණු සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :–

සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් ඇතුළුකර ගැනීම, ඔවුන් වර්ග කිරීම සහ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් සහ විධායක කමිටුව තෝරා පත් කර ගැනීම සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන් විසින් ඉටු කල යුතු කාර්ය භාරය;

(ඇ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවා විගණනය කිරීම; *සහ*

(ඉ) සාමාන්‍යයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ යම් රීතියක්, ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාක්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බලාත්මකව තිබුණු රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සළකනු ලැබිය යුතු ය.

පදනමෙන් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**7**. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

**8**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා

සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට හෝ බැදීමකට හෝ අයභාරයකට යටත් කිරීමට පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9**. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති නිලධරයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී නිලධරයන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන්, එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.